පලාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත 2011

---------------------------------------------------

1. <u>මතය.</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නැසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>.

2.1 <u>මූල්‍ය කාර්යය සාධනය.</u>

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ - ඌව පළාත සඳහා වියදම රු.1,078,043,188 ක් වූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,734,560,752 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2010 මාර්තු 31 සිට 2010 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 845,591,627 | 625,069,513 | 1,470,661,140 |
| මාර්ග නඩත්තුව | 111,495,347 | - | 111,495,347 |
| ලී බඩු හා සවි කිරීම් | 92,004 | 1,146,294 | 1,238,298 |
| කාර්යාලයීය උපකරණ | 2,346,667 | 2,070,197 | 4,416,864 |
| උපදේශක සේවා | 130,822,824 | 5,031,215 | 135,854,039 |
| පුහුණු හා වැඩ මුළු | 394,000 | - | 394,000 |
| වර්ධක හා මෙහෙයුම් පිරිවැය | 13,360,716 | 7,236,264 | 20,596,980 |
| ප්‍රත්‍යාගණන හා අගය අඩු කිරීමේ ගිණුම | (26,059,997) | 15,964,081 | (10,095,916) |
| එකතුව | 1,078,043,188 | 656,517,564 | 1,734,560,752 |

2.2 **<u>විශේෂ (ඩොලර්) ගිණුම.</u>**

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ඌව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - නැගෙනහිර සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - උතුර සඳහා වෙන් වශයෙන් විශේෂ (ඩොලර්) ගිණුම් 04 ක් විවෘත කර තිබුණි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඌව පළාත් විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 7,640,904.21 | 847,781,245 |
| **<u>එකතු කළා</u>** | | |
| ඌන පූර්ණය කිරීම් | 8,100,667.33 | 894,298,282 |
| විදේශ විනිමය වාසිය | - | 26,059,997 |
| | 15,741,571.54 | 1,768,139,524 |
| **<u>අඩු කළා</u>** | | |
| ආපසු ගැනීම් (විදේශාධාර) | 9,152,864.45 | 1,017,963,434 |
| ආපසු ගැනීම් (ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර) | 81,528.57 | 8,999,997 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,507,178.52 | 741,176,093 |

3. **<u>විගණන නිරීක්ෂණ</u>.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

1. සමාලෝචිත වර්ෂය අවසානය වන විට සංවර්ධනය කළයුතු මාර්ග 05 කින් මාර්ග 04 ක් සඳහා කාලය දීර්ඝ කිරීම ලබා දී තිබුණි. 2012 මැයි 29 දින මෙම මාර්ග පිළිබඳව කරන ලද භෞතික පරීක්ෂණයේ දී ඉදි කිරීම් වැඩ පිළිබඳ වැඩ සැළැස්ම ලබා ගත නොහැකි වූ හෙයින්, වැඩ සැළැස්මට අනුව, ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. නිශ්චිත කාල පරිච්ඡේදය තුළ දී ඉදි කිරීම් නිම කිරීමට හැකි වේද යන්න පිළිබඳ අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය විය. 2011 දෙසැම්බර් 31 දිනට මෙම මාර්ග පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

| මාර්ග අංකය | වැඩ ආරම්භ කිරීමේ දිනය | නිම කිරීමට නියමිත දිනය | දීර්ඝ කිරීමට ලබා දුන් දින ගණන | දීර්ඝ කිරීමෙන් පසු නිම කිරීමට නියමිත දිනය | 2011.12.31 දිනට භෞතික ප්‍රගතිය | 2011.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| ------- | --------------- | ----------- | ------------ | --------------- | ------------ | ------------- |
| | | | දින | | % | % |
| UVA 01 | 2010 නොවැම්බර් 01 | 2012 ඔක්තෝබර් 30 | 73 | 2013 ජනවාරි 11 | 44.06 | 52.00 |
| UVA 02 | 2010 නොවැම්බර් 01 | 2012 නොවැම්බර් 31 | - | 2012 නොවැම්බර් 30 | 24.03 | 28.00 |
| UVA 03 | 2010 නොවැම්බර් 08 | 2012 නොවැම්බර් 06 | 23 | 2012 නොවැම්බර් 29 | 35.01 | 34.59 |
| UVA 04 | 2010 නොවැම්බර් 26 | 2012 ඔක්තෝබර් 26 | 41 | 2012 දෙසැම්බර් 01 | 61.02 | 60.02 |
| UVA 05 | 2010 දෙසැම්බර් 05 | 2012 දෙසැම්බර් 05 | 25 | 2012 දෙසැම්බර් 30 | 36.04 | 42.25 |

2. නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ දී ව්‍යාපෘති අරමුණු ළඟා කර ගැනීම තහවුරු කරනු වස් ඉලක්ක සඳහා වගකීම් සඳහන් කර, මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව මූල්‍ය හා භෞතික ඉලක්ක අවධාරණය කරමින් ව්‍යාපෘතියේ සමස්ත කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර පිළියෙළ කළයුතුය. කෙසේ වුව ද, එවැනි සැලැස්මක් පිළියෙළ කර, ක්‍රියාත්මක කර නොතිබුණි.

3. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලේ ඇමුණුම් අංක 7 හි අංක 29 හා 30 ට අනුව, අභ්‍යන්තර විගණනයක් සිදු කළයුතු අතර, එහි කාර්තුමය වාර්තා ලෝක බැංකුවට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උප ශාඛාවට යැවියයුතුය. කාර්තුමය වාර්තා නිකුත් කරනු වෙනුවට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී එක් විගණන විමසුමක් පමණක් ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යතායතනයට යවා තිබුණු බව නිරීක්ෂණය විය.

4. රු.5,446,579 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වර්ෂය අවසානයට සිදු කළයුතු භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

5. 2011 ජූලි 10 දක්වා සේවය කළ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා භාවිතා කළ රු.197,735 ක් වටිනා උපකරණ 2012 මැයි 29 වන විටත් භාර දී නොතිබුණි.

6. 2011 අප්‍රේල් 01 දිනැති අංක උවිගෙ/බදු/01/2011 දරන දේශීය ආදායම් චක්‍රලේඛය ප්‍රකාරව, මසකට රු.50,000 කට වඩා ඉපැයීම් කරන සේවකයින්ගෙන් උපයන විට ගෙවීම් බදු අය කර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු වුවත්, 2011 අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා කාලයට අදාළව රු.48,142 ක් වූ උපයන විට ගෙවීම් බදු අය කර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.